


**ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම (AASL) වන අප විශිෂ්ටත්වය සඳහා විශිෂ්ටයින් බඳවා ගන්නා සහ සියලු දෙනාට සමාන රැකියා අවස්ථා ලබාදෙන සේවායෝජකයෙක් වන්නෙමු.**

**මෙම සමාගමේ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි (JIA) පවතින පහත සඳහන් තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## භූමි සහායක උපකරණ ක්‍රියාකරු තනතුර

**1. රැකියාවේ ස්වභාවය** : ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම (AASL) විසින් හසුරුවන දේශීය සහ ජාත්‍යන්තර ගුවන් ගමන් වලදී සම්මත ආරක්ෂක ක්‍රියා පටිපාටිවලට අනුකූලව නියමිත වේලාවට මෙහෙයුම් කටයුතු සිදු කිරීම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ඕනෑම ගුවන් තොටුපලක අවශ්‍ය භූමි සහායක උපකරණ (මෝටර් සහිත / මෝටර් රහිත) ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍ය සියලුම භූමි සහායක සේවා කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස සැපයීම.

**2. රැකියාවේ වගකීම** :

- පැමිණෙන ගුවන් යානා වලින් නිකුත් කරන ගමන් මලු, උපදෙස් අනුව සහ අදාල පන්තියට අනුව, පළමු බෑගය/ අවසාන බෑගය වේලාවන්ට අනුකූලව, කිසිදු ප්‍රමාදයකින් තොරව පැමිණීමේ ගමන් මලු පටි වෙත යොමු කිරීම.
- හුවමාරු ගමන් මලු මෙහෙයුම් කටයුතු නියමිත කාල සීමාව තුල කඩිනම්ව සිදු කිරීම සඳහා ප්‍රමුඛතා පදනම මත එම ගමන් මලු වර්ගීකරණය සිදු කරන ප්‍රදේශය වෙත රැගෙන යාම.
- භූමි සේවා උපකරණ භාර ගැනීමේදී සහ මෙහෙයුම් කටයුතු සඳහා යෙදවීමට පෙර, ප්‍රමාණවත් කාලයක් වෙන් කර සියලුම උපකරණ භාවිතයට සුදුසු තත්ත්වයේ පවතින බව සහතික කිරීම.
- කිසියම් උපකරණයක දෝශයක් හඳුනා ගතහොත්, ඒ පිළිබඳ අදාල නිලධාරීන් දැනුවත් කිරීම සහ තාක්ෂණික කාර්ය මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය කර එම උපකරණ අලුත්වැඩියා කර නැවත භාවිතයට සුදුසු තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- පිටත් වීමේ ගුවන් යානා නැවැත්වීමේ ස්ථානය වෙත ළඟා වීමට ගතවන රිය පැදවීමේ කාලය නිවැරදිව තීරණය කිරීම සඳහා සම්බන්ධ වන ගමන් මලු අදාල ගුවන් යානය වෙත ආරක්ෂිතව හා නියමිත වේලාවට ප්‍රවාහනය කර, නියමිත කාල සීමාව තුල ගමන් මලු පැටවීමේ කටයුතු අවසන් කිරීම සහතික කිරීම.

- සියලුම භූමි සහායක උපකරණ ගුවන් යානයේ ගමන් මාර්ගයෙන් ප්‍රමාණවත් දුරකින්, උපකරණ සීමා ප්‍රදේශයෙන් පිටත ආරක්ෂිතව ස්ථානගත කර ඇති බව සහතික කිරීම.

- ගුවන් යානය පැමිණීමට පෙර, භාවිතයට ගැනෙන සියලුම උපකරණ, ගමන් මලු ප්‍රවාහන කරත්ත (ට්‍රොලි / ඩොලි) සහ ULD හොඳ ක්‍රියාකාරී තත්ත්වයේ පවතින බවත්, ගුවන් යානා පරිශ්‍රයේ අවශ්‍ය ස්ථානයේ ඒවා ලබා ගත හැකිව පවතින බවත් සහතික කිරීම.

- ආයතනය විසින් සපයනු ලබන පුද්ගලික ආරක්ෂක උපකරණ සහ නිල ඇඳුම භාවිතයට සූදානම්ව සන්තකයේ තබා ගැනීම.

- ගුවන් යානය පැමිණීමට පෙර, ගුවන් යානය ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් භාවිතයට සුදුසු ආරක්ෂිත කෝණ (Safety Cones) පවතින බවත්, අවශ්‍ය ප්‍රමාණයට භාවිතයට සුදුසු රෝද අවහිරක (Chocks) ලබා ගත හැකි බවත්, ගුවන් යානා මෙහෙයුම් ප්‍රදේශ ආගන්තුක වස්තු හා අපද්‍රව්‍යය වලින් තොර බවත් සහතික කිරීම.

- දේශීය සහ ජාත්‍යන්තර ගුවන් යානා සඳහා අවශ්‍ය සේවා නියමිත වේලාවට සැපයීම සඳහා භූමි සහායක උපකරණ වන බිම් බල ඒකක, වායු සමීකරණ ඒකක, වායු ආරම්භක ඒකක සහ ජල / වැසිකිලි සේවා ඒකක නියමිත වේලාවට හා නිසි පරිදි ක්‍රියාත්මක කිරීම.

- මෙහෙයුම් කටයුතු වල ආරක්ෂාව සහතික කිරීම සහ උපකරණ වල භාවිතයට සුදුසු තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා උපකරණ නිසි පරිදි නඩත්තු කිරීම, පිරිසුදු කිරීම සහ දෛනික / කාලානුරූපී මෙහෙයුම් පරීක්ෂා කිරීම් සිදු කිරීම.

- ආයතනයට අදාල සියලුම රිය පැදවීමේ නීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීම.

- පැවරී ඇති සියලුම කාර්යයන් ඉටු කිරීමේදී ආයතනික තොරතුරු ආරක්ෂා වන ආකාරයටත්, AASL ප්‍රමිතීන් සහ ක්‍රියා පටිපාටි වලට අනුකූල වන ආකාරයටත් කටයුතු කිරීම සහතික කිරීම.

- භූමි සහායක උපකරණ ක්‍රියාකරුවෙකුගේ ඉහත සඳහන් ප්‍රධාන වගකීම් වලට අමතරව, අංශ ප්‍රධානියා හෝ බලයලත් නිලධාරියෙකු විසින් පවරනු ලබන වෙනත් අදාල වගකීම් ඉටු කිරීම.

**3. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්** :

1. අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් 6ක් සමත් විය යුතුය.
2. වලංගු බර වාහන රියැදුරු බලපත්‍රයක් තිබිය යුතුය.
3. භූමි සහායක උපකරණ හැසිරවීම පිළිබඳ මනා දැනුමක් තිබීම.

**4. පලපුරුද්ද** : සමස්ත වසර 10ක සේවා පලපුරුද්දක් තිබිය යුතු අතර, එයින් අවම වශයෙන් වසර 05ක පලපුරුද්දක් ගුවන් යානා උපකරණ ක්‍රියාකරුවෙකු ලෙස ලබා තිබිය යුතුය.

**5. වයස** අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට වයස අවුරුදු 50ට නොවැඩි විය යුතුය.

**6. බඳවා ගැනීමේ ක්‍රමය** : සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**<u>පොදු කරුණු</u>**

**භාෂා කුසලතාව : ඉංග්‍රීසි සහ සිංහල භාෂාවන් සඳහා මනා ලිඛිත හා වාචික සන්නිවේදන කුසලතාවක් තිබීම අවශ්‍ය වන අතර දෙමළ භාෂාව කතා කිරීමට ඇති හැකියාව අමතර සුදුසුකමක් වේ.**

**යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි (JIA) පවතින පුරප්පාඩු පිරවීම සඳහා උතුරු සහ නැගෙනහිර පළාත්වල අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය ලබාදෙනු ලැබේ.**

**යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි (JIA) සේවය සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට නවාතැන් සහ ප්‍රවාහන පහසුකම් අප සමාගම විසින් සපයනු නොලැබේ.**

ඉහත තනතුර සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් අවශ්‍ය අවස්ථා වලදී සමාගමට අයත් දිවයිනේ පිහිටි ඕනෑම ස්ථානයක සේවය කල යුතුවේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සකස් කළ අයදුම්පතක් පහත ලිපිනයට **2026 ඔක්තෝබර් මස 01 වන දිනට පෙර** ලැබෙන සේ **ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවාව මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කල යුතුවේ.

**සුදුසුකම් සනාථ කිරීමට අදාල සහතික වල ජායා පිටපත් සමඟ ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අනුමත මාධ්‍ය වලින් හැර වෙනත් මාධ්‍යයන්ගෙන් ඉදිරිපත් කරන අයදුම්පත් සහ අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයෙන් පසුව මෙම කාර්යාලය වෙත ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**මෙම පුරප්පාඩු දැන්වීම අවලංගු කිරීම හෝ නැවත කැඳවීමේ පූර්ණ අයිතිය සමාගම සතු වන අතර තෝරා ගැනීම් ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.**

මෙම දැන්වීමේ සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ පරිවර්තනයන්හි සඳහන් කරුණු පිළිබඳ අපැහැදිලිතාවයක් ඇති වුවහොත් ඉංග්‍රීසි දැන්වීමේ සඳහන් කරුණු බලපැවැත්වෙන බව කරුණාවෙන් සලකන්න.

---

**සභාපති**

**ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම**

**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**

**කටුනායක**

**දිනය - 13/09/2026**